දිනමිණ සිළුමිණ
The Dinamina
The Silumina
epaper

# ප්‍රධාන විධායක නිලධාරී
# සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය

ජාතික ණය සුරැකුම් ආයතනය (The National Credit Guarantee Institution Limited (NCGI)) යනු මෙරට ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයට සහය දැක්වීමේ අරමුණින් රජය සහ ප්‍රමුඛ පෙළ මූල්‍ය ආයතන 13ක් සමඟ පිහිටුවා ඇති රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ආයතනයකි. ශීඝ්‍රයෙන් වෙනස් වන වෙළඳපොළ ඉල්ලුම, තාක්‍ෂණය සහ සීමිත මූල්‍ය ප්‍රවේශය හේතුවෙන් ව්‍යාපාර දියුණු කිරීමට ඇති හැකියාවන් ගේ පවතින සීමාවන් නිසා ඇතිවන බාධා ජයගනිමින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වර්ධනයට අවශ්‍ය පහසුකම් ලබා ගැනීමේදී මුහුණදීමට සිදුවන සුරැකුම් පිළිබඳ ගැටලු නිරාකරණය කරගැනීම සඳහා ඇපකර පහසුකමක් ලබා දීමට රජයෙන් මෙම සමාගමට සහාය වේ.

ජාතික ණය සුරැකුම් ආයතනය ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ වර්ධනය වේගවත් කිරීමට හැකියාවක් ඇති අපේක්ෂකයෙක් සොයමින් සිටී. මෙය නව සමාගමක් වන අතර, තහවුරු කළ නායකත්ව කුසලතා, බහු පාර්ශ්වකරුවන් සමඟ වැඩ කිරීමේ හැකියාව, සබඳතා කළමනාකරණය කිරීම හා අසීමාන්තික පරිකල්පන හැකියාවන් යොදාගනිමින් ඉලක්ක සපුරාලීම සඳහා දක්ෂ කණ්ඩායමක් මෙහෙයවීම සහ ප්‍රතිඵල ඇගයුමට ලක් කිරීමේදී දත්ත සහ පුද්ගලයින්ගේ ක්‍රියාකාරකම් මත පදනම්ව කටයුතු කරන අයදුම්කරුවන් සඳහා එය අනගි අවස්ථාවක් වනු ඇත.

***අප සොයන පුද්ගලයා ඔබද;***

## සුදුසුකම්

- ව්‍යාපාර පරිපාලනය, මූල්‍ය හෝ ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් හෝ ඊට සමාන වෘත්තීය සුදුසුකමක් (ACIB, CFA, ACA, ACCA, CIMA)
- මූල්‍ය ක්ෂේත්‍රයේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශ සඳහා ණය දීමේ අවම හෝ ඊට සමාන රැකියා තනතුරු කළමනාකරණය කිරීමේ තහවුරු කළ පළපුරුද්දක් සහ ප්‍රවීණත්වයක් සමඟින් බැංකු ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් අවුරුදු පහළොවක පළපුරුද්දක් සහ
- 2024 මාර්තු 01 දිනට උපරිම වයස අවුරුදු 62 වීම.

## ප්‍රධාන වගකීම්

රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආර්ථික විශේෂඥයින්, බැංකුකරුවන්, මූල්‍ය සහ නීති වෘත්තිකයන්ගෙන් සැදුම්ලත් මණ්ඩලයක් ඔබට සහාය වනු ඇති අතර ඔබ සපුරාලිය යුතු වනුයේ,

- ජාතික ණය සුරැකුම් ආයතනයහි දැක්ම සඳහා කටයුතු කිරීමට උපාය මාර්ග සංවර්ධනය කිරීම සහ ආයතනයේ අපේක්ෂාවන් සැලසුම් කිරීම.
- කාර්යාලයක් පිහිටුවීම, බැංකු සහ ආයෝජන ගිණුම් විවෘත කිරීම, මෘදුකාංග සහ උපකරණ ලබා ගැනීම සහ පිහිටුවන ලද ආයතනයේ මෙහෙයුම් සඳහා මෙහෙයුම් කාර්ය මණ්ඩලය බඳවා ගැනීම.
- දෙපාර්තමේන්තු මෙහෙයුම් කටයුතු සිදු කිරීම සඳහා මෙහෙයුම් සැලසුම් සකස් කිරීම සහ ඒවා නියමිත ලෙසට හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා මෙහෙයුම් කාර්ය මණ්ඩලයට උපාය මාර්ගික උපදෙස් ලබා දීම.
- අයවැයකරණය, අරමුදල් කළමනාකරණය සහ විගණනය ඇතුළුව ආයතනයේ මූල්‍ය ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සහ ඉහළ මට්ටමේ අනුකූලතාව සහ යහපාලනය පවත්වාගෙන යාම.
- ආයතනයේ විශේෂිත මූල්‍ය නිර්නායක වන කාන්තා මූලික ව්‍යාපාර හා දේශගුණික මූල්‍යකරණය සපුරාලීම සඳහා ප්‍රතිලාභී කළඹක් ගොඩනැගීමේ වගකීම දැරීම හා ඇපකර යෝජනාක්‍රමයේ උපරිම ප්‍රයෝජනය ලබා ගැනීම සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතනවලට උපදෙස් සහ පුහුණුව ලබා දීම.
- ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී උපරිම ප්‍රතිලාභ ලබා දීම සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශ සමඟ වැඩ කිරීම සඳහා ආයතනික සේවාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සකස් කිරීම.
- මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය සහ ආසියානු සංවර්ධන බැංකුව ඇතුළු ප්‍රධාන පාර්ශ්වකරුවන් අතර සන්නිවේදන සහ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

## කොන්ත්‍රාත් කාලය සහ වැටුප් පරිමාණය

කාර්යසාධනය මත පදනම් වන වසර 3ක කොන්ත්‍රාත්තුවක් සහ තෝරාගත් අපේක්ෂකයා සඳහා ආකර්ෂණීය වැටුප් පැකේජයක් ලබා දෙනු ලැබේ.

## තෝරාගනු ලබන පටිපාටිය

තෝරා ගැනීම විධිමත් සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියක් හරහා සිදු කරනු ලබන අතර තේරීම් ක්‍රියාවලියේ සෑම අදියරකදීම සුදුසුකම් ලත් අපේක්ෂකයින්ට පමණක් දැනුම් දෙන බව කරුණාවෙන් සලකන්න.

මේ සම්බන්ධයෙන් ඔබ උනන්දුවක් දක්වන්නේ නම් සහ අදාළ සුදුසුකම් සපුරාලන්නේ නම්, කරුණාකර ඔබගේ සම්පූර්ණ ජීව දත්ත තොරතුරු පත්‍රය ඥාතීන් නොවන වෘත්තීමය පුද්ගලයින් දෙදෙනෙකුගේ විමසීම් තොරතුරු සමඟ PDF ආකෘතියෙන් *addisec@mo.treasury.gov.lk* වෙත යොමු කර එහි දෘඩ පිටපතක් පහත ලිපිනයට 2024 පෙබරවාරි 26 වැනි දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් යොමුකරන්න. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන ලද තනතුර සඳහන් කරන්න.

**අතිරේක ලේකම්**
**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය,**
**මහ ලේකම් කාර්යාලය,**
**කොළඹ 01.**